පාලි හා බෞද්ධ අධ්‍යයන : දේශීය හා ගෝලීය අවශ්‍යතා හා අභියෝග*

ජෝතිය ධීරසේකර

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත්උපාධි ආයතනය උත්සවාකාරයෙන් විවෘතකිරීම ප්‍රකාශයට පත්කෙරෙන අද දින ශ්‍රී ලංකාවාසී පුරවැසියන් වන අප සියළු දෙනාට ම සහේතුකව සතුටු විය හැකි බවට කිසිදු සැකයක් නොමැත. මිහිඳු මහ රහතන්වහන්සේ මෙරටට වැඩම කිරීමේ සිද්ධියෙහි ඇති වැදගත්කමට නොදෙවෙනි වැදගත් කමක් ශ්‍රී ලංකාවේ අනාගත පරම්පරාව විෂයෙහි ලා මෙම සිදුවීම පදනම් කරගෙන ඇතිවන පරිදි ක්‍රියාකිරීමේ වගකීම අප වෙත පැවරී තිබේ. බුදුරදුන්ගේ ඉපදීම, බුද්ධත්වයට පත්වීම සහ පරිනිර්වාණය සිදුවූ භූමියෙන් එනම් ඉන්දියාවෙන් බුදුසමයේ මූලික අනන්‍යතාව අතුරුදන්වීමට පෙර මුල් වසර දෙසියයක කාලය තුළ ම ශ්‍රී ලංකාවාසීන් වන අප බුදුරදුන්ගේ ඉගැන්වීම් උරුම වීමට තරම් වාසනාව ලද්දවුන් වීමු.

ධර්මය පිළිබඳව පැවැති විවිධ අදහස් ගොනුකොට ගෙන අශෝක අධිරාජයාගේ සමය වන විට ඉන්දියාවේ බුදුසමය විවිධ පාර්ශවයන්ට භින්නව තිබුණි. භික්ෂු සමාජයේ ගෞරවණීය තත්වයෙහි ප්‍රශස්ත බව පවා යම් පමණකින් පරිහාණියට පත්ව තිබුණු බව ද සත්‍යයකි. තත්වය එසේ වුව ද විචක්ෂණ බුද්ධියෙන් සහ සුපරීක්ෂාකාරී ශාස්ත්‍රීය කෞශල්‍යයෙන් යුතු

---

* පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත්උපාධි ආයතනය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී විවෘත කරන ලද අවස්ථාවේදී මහාචාර්ය ජෝතිය ධීරසේකර මහතා - එවකට බෞද්ධ විශ්ව කෝෂයෙහි ප්‍රධාන කර්තෘ (දැන් පූජ්‍ය මහාචාර්ය ධම්මවිහාරී හිමියන්) විසින් පවත්වනු ලැබූ ආරම්භක දේශනය.